**මාවනැල්ල ප්‍රාදේශීය සභාව - 2020**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයනලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) පනතේ 6(i)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6(i)(ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ ඉඩම් කට්ටි කිරීමේ දී පොදු පහසුකම් සඳහා සභාවට වෙන්කළ රු.6,875,000 ක් වූ ඉඩම් කොටස් 09 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | මෙම ඉඩම් කොටස් 09 හි වටිනාකම 2021 වර්ෂයේ අවසාන ගිණුම් සකස් කිරීමේදී ප්‍රාග්ධනිත කරන බව දන්වා තිබුණි. | සභාවට අයත් ඉඩම් ප්‍රාග්ධනිත කළ යුතුයි. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. 109,799,630 ක් හා උපලේඛන අනුව වටිනාකම රු. 109,554,279 ක් වූයෙන් රු. 311,461 ක වෙනසක් විය. | සේවක ණය ගිණුමේ වෙනස මේ වන විටද නිවැරදි කිරීමට කටයුතු කරමින් සිටින බවද පළාත් සභා ණය හිමි ශේෂය හා පලාත් සභා ජංගම ගිණුමේ ශේෂය එකතුව ලෙස පෙන්වා දී ඇති බවද දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ශේෂයන් ඊට අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතුයි. |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි 571(3) | ආපසු නොගෙවන කර්මාන්ත ගිවිසුම් තැන්පත්, මස්/මාළු කඩ හා විනෝද බදු තැන්පත් රු.1,253,375ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම කරුණු පිළිබඳව ඉදිරියේදී සොයාබලා කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 200,260,359 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 124,649,146 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟ ශේෂය රු.11,617,565 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂය පුරාම පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් මෙම මුදල් අය කර ගැනිමේ යම් පුමාදයක් සිදු වි ඇති බවත් හිග මුදලද සමග අය කර වරිපනම් බදු මුදල ප්‍රශස්ත මට්ටම කරා ලගා කර ගැනිමට මෙම වසර තුල සියළු උත්සාහයන් දරන බවත් දන්වා තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කර හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට අක්කර බදු හිඟ ශේෂය රු.189,217 ක් විය. | වසර දෙකක පමණ සිට රට තුල පැවති කොරෝනා තත්වය හේතුවෙන් මෙම ආදායම් අය කිරිමේදී යම් අඩුවීමක් ඇති වී පවතින බව දන්වා තිබුණි. | හිඟ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ආ) | කුලී<br>---- | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කුලී ශේෂය රු.12,618,066ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී තවදුරටත් සොයා බලා කටයුතු කරන බව දන්වා තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කර හිඟ කුලී අයකර ගත යුතුයි. |
| (ඇ) | උසාවි දඩ<br>----------- | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු උසාවි දඩ ශේෂය රු.15,165,945 ක් විය.මෙම මුදල් ගෙන්වා ගැනීම සඳහා නිරන්තර ලිපි මගින් පළාත් සභාව දැනුවත්කර තිබුණද ලැබී නොතිබුණි. | උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගැනීම සඳහා නිරන්තර ලිපි මගින් පළාත් සභාව දැනුවත්කර ඇති බව දන්වා තිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------ | ---------------------- |
| (අ) | මාවනැල්ල බාලදක්ෂ මාවතේ නව සතිපොළ ගොඩනැගිල්ලේ පිහිටි බදු පදනමින් ලබා දී තිබුණු කඩ කාමර 24ක් වසා දමා තිබුණ ද දිගින් දිගටම බිල් කිරිම නිසා රු.2,153,520 ක සාවද්‍ය ආදායමක් ගිණුම් වල දක්වා තිබුණි. | නව සතිපොල කඩකාමර කුලී සහ ගිවිසුම් ගත නොවූ කඩ කාමර නැවත සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමට 2021 මාර්තු මස මහා සභාව වෙත යොමු කරන බව දන්වා තිබුණි. | ආදායම් උපයා ගැනීමට අවශ්‍ය කටයුතු යෙදිය යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පිඹුරු අංක 10217A/2016 දරන බුළුගොල්ලෙවත්ත සහ දැල්ලගහමුල වත්ත ඉඩමෙහි කැබලි අංක 03 සංවර්ධනය සඳහා අවසර දී නොතිබූ අතර ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ලබා දී තිබූ නිර්දේශ අනුව වගුරු ස්වභාවයක් සහිත මෙම ඉඩම ඉදිකිරීම් සඳහා යෝග්‍ය නොවන බව තහවුරු කර තිබියදීත්, එම කොටස විකුණා එහි නිවසක් ඉදිකර තිබුණු අතර ඒ පිළිබඳ සභාවේ නිසි අධීක්ෂණයක් සිදුවී නොතිබුණි. | ඉඩම සංවර්ධනය කිරීම සඳහා පමණක් බලපත්‍රයක් ලබාදී ඇති අතර කිසිදු ඉදිකිරීමක් සිදුකිරීමට අනුමැතිය ලබාදී නොමැති බව දන්වා තිබුණි. | නීත්‍යානුකූල නොවන කටයුතු සම්බන්ධයෙන් සභාව විසින් අදාල පියවර ගත යුතුයි. |
| (ඇ) | පිඹුරු අංක 9806/2015 දරන වාගොල්ලහේන ඉඩම කට්ටිකර විකිණීමේදී කැබලි අංක 5 කට අදාලව ප්‍රවේශ මාර්ගය සහ කානු පද්ධතිය ද කැබලි අංක 8කට අදාලව යාබද කානු පද්ධතියද, ඉදිකර නොතිබුණු අතර කැබලි අංක 6 කට අදාලව යාබද කානු පද්ධතිය අඩුපාඩු සහිතව ඉදිකර තිබුණි.<br>මේ අනුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 4.3 මූලික කොන්දේසි ඉටුකර නොතිබූ අතර එහි 5.3.1 හි නිර්දේශය අනුව ඉවුරු ඛාදනය අවම කිරීමට ජීව වැටි හෝ විධිමත් ආධාරක බැම්මක් ඉදිකිරීමද කර නොතිබුණි. | ඉඩමේ කට්ටිවල ඉදිකිරීම් සිදු කිරීමේදී නැවත වරක් සභාව වෙතින් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අනුමැතියට යොමුකල පසුව මේ පිළිබඳ සලකා බලා කටයුතු කරන බව දන්වා තිබුණි. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ කොන්දේසි හා නිර්දේශ ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ඈ) | පිඹුරු අංක 9655/2015 දරන ඉඩම කොටස්කර විකිණීමේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ කොන්දේසි, නිගමන හා නිර්දේශ නොසලකා හැර සංවර්ධන කටයුතු සඳහා අවසර දී තිබුණු අතර කැබලි අංක 54 සංවර්ධනයට යෝග්‍ය නොවන බව කාර්මික නිලධාරි නිර්දේශ කර තිබුණද එම ඉඩම විකුණා තිබූ බවට ප්‍රදර්ශනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ කොන්දේසි අංක 07,14 හා 15 ට අනුවද, මධ්‍යම පරිසර අධිකාරියේ කොන්දේසි අංක 07 හා 2.2 ට අනුව ද කටයුතු කර නොතිබුණි. ඒ අනුව අදාළ ආයතනවල නිර්දේශ රහිතව ඉඩමේ 1 සිට 39 දක්වා බිම් කොටස් විකුණා ඇති අතර සම්පූර්ණ ඉඩම හෙක්ටයාර් 01 ට වඩා වැඩි වන බැවින් පොදු කටයුතු සඳහා සභාවට පැවරිය යුතු ඉඩම් කොටස් ද පවරා නොතිබුණි. | ඉඩම් කට්ටි සංවර්ධනය සඳහා පමණක් අනුමැතිය දී ඇති අතර අඩුපාඩු සකස් කර ගැනීමට සභාවට මැදිහත් වී කල හැකි කිසිවක් නොමැති බව දන්වා තිබුණි. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ කොන්දේසි නිගමන හා නිර්දේශ ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

**3.3 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහජනයාට කඩිනමින් ප්‍රවිෂ්ය විය හැකි ප්‍රදේශයක නව සතිපොළ ඉදිකිරීම් නොකිරීම හේතුවෙන් රු.5,111,180 ක් වටිනා ගොඩනැගිලි නිෂ්කාර්යව පැවතුණි. | විගණනය විසින් පෙන්වා දෙන ලද මෙම කරුණ පිළිබඳව ඉදිරියේදී විශේෂ අවධානය යොමු කර කටයුතු කරන බව දන්වා තිබුණි. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුයි. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සභා බල ප්‍රදේශයේ හෙක්ටයාර් 01 ට වැඩි ඉඩම් කට්ටි කිරීමේ දී පොදු පහසුකම් සඳහා සභාවට වෙන් කළ යුතු ඉඩම් අක්.01 රූඩ් 2 පර්. 24.38ක් නීත්‍යානුකූලව පවරාගැනිමට කටයුතු කර නොතිබුණි. | අදාල ඉඩම් කොටස් පවරා ගැනිම සඳහා මේ වන විට අදාල සමාගම් වෙත දන්වා යවා ඇති අතර ඉදිරියේදී මෙම කාර්යය පිළිබඳව විශේෂ අවධානය යොමු කර කටයුතුකරන බව දන්වා තිබුණි. | පොදු පහසුකම් සඳහා සභාවට වෙන්කල යුතු ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | බුළුගොල්ලහේන ගෝන්දිවෙල පිහිටි පිඹුරු අංක 3700 දරන ඉඩම කොටස්කර විකිණීමේදී පොදු කටයුතු සඳහා සභාව වෙත පවරා දී තිබුණු පර්චස් 39.9 ක ඉඩම් කොටසෙහි ආරක්ෂිත වැටක් ඉදිකර නොතිබූ බැවින් අනවසර අත්පත්කර ගැනීමකට ඉඩ සැලසී තිබුණි. | ඉදිරියේදී සොයා බලා පොදු කටයුතු සඳහා වෙන් කර ඇති කොටස සඳහා වැටවල් ගසා සභාව වෙත පවරා ගැනිමට කටයුතු කරන බව දන්වා තිබුණි. | සභාව සතු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුයි. |